# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2148/10 - 2019 නොවැම්බර් මස 04 වැනි සඳුදා - 2019.11.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/03/2018/78 නඩු අංකය ඒ/26/2019

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.22 දිනැති හා අංක 2115/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මධුරාගොඩ, කොටුහේන, ඒ. ඒ. කරුණාරත්න මයා ඇතුළු සේවක පිරිස සහ කොළඹ 05, නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, අංක 561/3 හි පිහිටි කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.10.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019, ඔක්තෝබර් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/03/2018/78

කාර්මික අධිකරණයේදී ය

ඒ. ඒ. කරුණාරත්න මයා,
ඇතුළු සේවක පිරිස,
කොටුහේන,
මදුරාගොඩ.

*ඉල්ලුම්කරුවන්*

එරෙහි

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,
නො. 561/3, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

වගඋත්තරකරු

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර ගරු අමාත්‍ය 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.03.14 දින මාතලේ, මේල්පිටිය, නො. 75 එස්. කාරියවසම් වන මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශ්වය අතර පවත්නා ආරවුල මෙසේ සඳහන් වේ.

''2013 ජුනි මාසයට පෙර බඳවාගෙන ඇති සේවකයන්ට ගෙවනු ලබන විශේෂ දීමනාව 2013 ජුනි මාසයෙන් පසු බඳවා ගනු ලැබූ ඒ. ඒ. කරුණාරත්න මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයන් 08 දෙනාට හිමි ද? කිසිදු හේතුවකින් තොරව 2013 ජුනි මාසයෙන් පසුව නොගෙවා සිටීමෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔවුන්ට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01. ඒ. ඒ. කරුණාරත්න
02. කේ. ඩී. ඒ. සුනිල් ප්‍රේමතිලක
03. ඩබ්. ඒ. එන්. දයාරත්න
04. කේ. ඩී. ඒ. නිමල් රාජරත්න
05. ඒ. යූ. විජේසිංහ
06. එස්. ඩී. කරුණාසේන
07. ආර්. ඩී. විලියොම්
08. කේ. එම්. එන්. එස්. කෝනාර

යන අය වෙති.

ප්‍රථමයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු 02 වන දින අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගයෙන් දැක්වෙන පරිදි දෙපාර්ශවයේ ආරවුලට පාදක කරුණු පිළිබඳව දෙපාර්ශ්වයෙන් විස්තර කැඳවන ලදහ.

විභාගය සඳහා 2019.06.13 වන දින මෙම නඩුව කැඳවන ලදුව, ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඒ. ඒ. කරුණාරත්න මහතා සමග අනිත් ඉල්ලුම්කරුවන් පෙනී සිටි අතර වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් එහි පරිපාලන නිලධාරී අයි. එල්. එම්. මොහොමඩ් මහතා සහ නීතිඥ ආනන්ද සහබන්දු මහතා පෙනී සිටියහ.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් කියා සිටියේ,

(i) ආයතනයේ සේවකයන් 80 ක් සේවයේ යෙදෙන බව,
(ii) පඩි පාලක සභාව යටතට ගැනෙන සේවකයන් හට පඩියට අමතරව රු.7800.00 ක දීමනාවක් ලැබෙන බව,
(iii) මෙම ඉල්ලුම්කරුවන් 08 දෙනාට එසේ නොලැබෙන බවත්,

යන කරුණු ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් විය.

මේ අවස්ථාවේ දී වග උත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා පහත කරුණු ඉදිරිපත් කරන ලදී.

(i) කාර්මික සම්බන්ධතා අංශයට මෙම ගැටලුව ඉදිරිපත් කළ බව,
(ii) 2018.07.11 වන දින ලබාදුන් ලිඛිත නියෝගයට අනුව වග උත්තරකාර පාර්ශවය ඉදිරිපත් කරන ලද කරුණු පිළි ගත්තේ ද නැද්ද යන්න තමා නොදන්නා බව,
(iii) වග උත්තරකාර පාර්ශවය බේරුම්කරණය වෙත කරුණු ඉදිරිපත් කළ බව,
(iv) ඉල්ලුම්කරුවන් විසින් ජීවනාධාර දීමනාව සහ මිහිතුළ ආධාර දීමනාව උපරිමය ලෙස රු. 7800.00 ක් ඉල්ලා සිටින බව,
(v) ඉල්ලුම්කරුවන් මෙම දීමනා 2019 මැයි මාසයේ සිට ගෙවන ලෙස ඉල්ලා සිටින බව,
(vi) 2019.07.15 වන දින ඉල්ලුම්කරුවන් 08 දෙනා අතරින් කේ. එම්. එන්. එස්. කෝනාර යන අය අනිකුත් සේවකයන් 07 දෙනා ලෙසින් සේවයට බැඳී නොමැති බව, යන කරුණු ඉදිරිපත් වීමෙන් අනතුරුව එකී කරුණු වග උත්තරකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බව හෙළි කළේ ය.

2019.08.15 වන දින පැවති විභාගයේ දී සමථ කොන්දේසි මෙසේ ඉදිරිපත් කරන ලදී. එනම්,

(i) මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් 08 දෙනා අතරින් කේ. එම්. එන්. එස්. කෝනාර යන අය හැර අනිකුත් සේවකයන් 07 දෙනා සඳහා ඉල්ලා සිටින ලද සහන සැලසීමට සේවා යෝජක පක්ෂය පිළිගනී.
(ii) මෙම ඉල්ලුම්කාර පාර්ශවයේ සේවකයන් නඩු අංක 23/කු/82218230 දරන කුරුණෑගල කම්කරු විනිශ්චය සභාවට කරන ලද ඉල්ලීම හේතු කොටගෙන එකී කම්කරු විනිශ්චය සභාවේ තීරණය වූ පරිදි 2005.12.18 දිනැති අවසන් සමථය පරිදි හිඟ වැටුප් රහිතව සේවය කඩ නොවන පරිදි යළි සේවයේ පිහිටුවන ලෙස කරන ලද නියෝගය දෙපාර්ශවය පිළිගනී.
(iii) 2005.02.09 දිනැති වග උත්තරකාර ආයතනයේ සභාපතිගේ ලිපිය ප්‍රකාරව 2005.02.10 වන දින සිට යළි සේවයේ යෙදවීම දෙපාර්ශවයම පිළිගනී.
(iv) මෙම සේවකයන් කාලීන ගිවිසුම් යටතේ සේවය කරන සේවකයන් බව දෙපාර්ශවය පිළිගනී.
(v) වසර 15 ක කාලයක් දේශපාලන පළි ගැනීම්වලට ලක් වූ බැවි සිය අභියාචනාවලදී කරන ලද දූන්වීම් වග උත්තරකාර පාර්ශවය පිළිගනී.
(vi) මෙම ඉල්ලුම්කාර සේවකයන් රු. 7800.00 ක දීමනාව පහත පරිදි සමන්විත වන අතර මසකට දින 30 ක් සේවය කරන බවට උපකල්පනය කෙරේ.

| | | |
|---|---|---|
| (අ) දිනකට මිහිතුළ දීමනාව | රු. | 20.00 |
| (ආ) දිනකට ජීවන වියදම් දීමනාව | රු. | 195.00 |
| (ඇ) 2012 අයවැය සහන දීමනාව | රු. | 49.20 |
| එකතුව | රු. | 264.20 |

මේ වන විට අයවැය සහන දීමනාව අහෝසි වී ඇති බැවින් ඉහත (අ) සහ (ආ) යන දීමනා පමණක් ගෙවීමට හා ලැබීමට එකඟ වෙති.

(vii) මෙම ගැටලුව සම්බන්ධ විශේෂ දීමනාව වෙනුවෙන් එකගාවය ඉල්ලුම්කරුවන් සියලුදෙනා පළ කර සිටින අතර ඉහත දීමනාව 2019 ජූලි මස සිට ගෙවීම ආරම්භ කළ යුතු බවට දෙපාර්ශවය පිළිගනී.

ඉහත කරුණු අන්තර්ගත කරන ලද ප්‍රදානය ඉදිරිපත් කරන අතර එකී ප්‍රදානය පහත සඳහන් ඉල්ලුම්කරුවන් 07 දෙනා සඳහා පමණක් අදාළ වන අතර කේ. එම්. එන්. එස්. කෝනාර යන ඉල්ලුම්කරුට බලනොපාන බැව්ද සඳහන් කර සිටිමි. යොමුවේ සඳහන් පැනයට පිළිතුරු 2013 ජුනි මාසයෙන් පසුව නොගෙවා සිටින ලද විශේෂ දීමනාව පහත සඳහන් සේවකයන් 07 දෙනාටද නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව ඇති බැවින් එය තවදුරටත් ගෙවීමට මෙම බේරුම්කරණයේදී වග උත්තරකරුවන් කැමැත්ත පළ කිරීමෙන් මෙම කම්කරු ආරවුල නිමාවට පත් වූ බැවි සතුටින් පළ කොට සිටිමි. අදාළ සේවකයන් 07 දෙනා නඩු ගොනුවේ අත්සන් යොදා සිය මනාපය පළ කොට ඇත. අදාළ සේවකයන් 07 දෙනා පහත පරිදි වේ.

01. ඒ. ඒ. කරුණාරත්න
02. කේ. ඩී. ඒ. සුනිල් ප්‍රේමතිලක
03. ඩබ්. ඒ. එන්. දයාරත්න
04. කේ. ඩී. ඒ. නිමල් රාජරත්න
05. ඒ. යූ. විජේසිංහ
06. එස්. ඩී. කරුණාසේන
07. ආර්. ඩී. විලියොම් යනාදීහූ වෙති.

යොමුවේ සඳහන් කේ. එම්. එන්. එස්. කෝනාර යන අය ප්‍රදානය ලබා දීමේදී ඉවත් කරන ලෙස ඉල්ලුම්කාර සහ වග උත්තරකාර යන දෙපාර්ශවය පිළිගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රදානය මෙසේ අවසන් කරන අතර එය සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

2019.10.01 වන දින කාර්මික අධිකරණයේ දී ය.

මෙයට,
නීතිඥ හා බේරුම්කරු,
එස්. කාරියවසම්.

11 - 1251

---

මගේ අංක - IR/COM/05/2018/120

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.02.14 දිනැති හා අංක 2110/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් නුගේගොඩ, නාලන්දාරාම පාර, අංක 45 හි පදිංචි එච්. ජී. ඒ. එස්. සෙනවිරත්න මයා, හොරණ, බැල්ලපිටිය, පන්සල හන්දිය, අංක 386 හි පදිංචි ජී. ඩී. තිදස් හරිචන්ද් මයා, කළුතර උතුර, විලෝගොඩ, රෝසවත්ත, පදිංචි එන්. එස්. එස්. කුමාරගේ මයා, සහ මල්වාන, වල්ගම, බියගම අපනයන සැකසුම් කලාපය, බ්ලොක් ඒ, ලොට් 15, පිහිටි ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.10.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019, ඔක්තෝබර් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/05/2018/120

කාර්මික අධිකරණයේදී ය

1. එච්. ජී. ඒ. එස්. සෙනෙවිරත්න මයා,
නො. 45, නාලන්දාරාම පාර,
නුගේගොඩ.

2. ජී. ඩී. තිදස් හරිචන්ද්‍ර මයා,
නො. 386, පන්සල හන්දිය,
බැල්ලපිටිය, හොරණ.

3. එන්. එස්. එස්. කුමාරගේ මයා,
රෝසවත්ත,
විලේගොඩ,
කළුතර උතුර.

*(පැමිණිලිකාර පාර්ශවය)*

නඩු අංකය : ඒ/07/2019

සහ

ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ්,
ලොට් 15, බ්ලොක් ''A'',
බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම, මල්වාන.

(වගඋත්තරකාර පාර්ශවය)

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එල්. ආර්. සුමතිපාල වන මා 2019.02.07 වන දින පත් කර ඇත.

උද්ගතව පවත්නා ආරාවුලේ ස්වභාවය :

මෙහි වගඋත්තරකාර පාර්ශ්වය වන ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් හි සේවයේ නිරතව සිටි,

01. එච්. ජී. ඒ. එස්. සෙනෙවිරත්න
02. ජී. ඩී. තිදස් හරිචන්ද්‍ර
03. එන්. එස්. එස්. කුමාරගේ යන අයට හිමි ප්‍රවාහන දීමනා ද ඊට අමතර වශයෙන් කුමාරගේ යන අයට හිමි රියදුරු දීමනා ද ඔවුන්ට නොගෙවීම නිසා අසාධාරණයක් සිදුව තිබෙන බවට වූ ආරාවුලකි.

පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම,

ඉහත සඳහන් කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වූ නඩුව විභාගයට ගැනීමට පෙරාතුවම 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු මස 02 වැනි දිනැති හා අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරාවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගය පරිදි මෙකී ආරාවුලට හේතු වී ඇති කරුණු කාරණා සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් වෙතින් විස්තර ප්‍රකාශ ඉල්ලා සිටි අතර එහිදී පැමිණිලි පාර්ශවය මෙන්ම වගඋත්තරකාර පාර්ශ්වය විසින් ද ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබේ. පැමිණිලිකාර පාර්ශවය විසින් 2019 ක් වූ මාර්තු මස 11 වන දින ද වගඋත්තරකාර පාර්ශවය විසින් වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 08 වන දින ද කරුණු ඉදිරිපත් කර ඇත. ඉන් ඉක්බිතිව වර්ෂ 2019 ක් වූ මැයි මස 23 වන දිනැතිව පැමිණිලිකාර පාර්ශවය විසින් ද වර්ෂ 2019 ක් වූ මැයි මස 29 වන දිනැති ව වගඋත්තරකාර පාර්ශවය විසින් ද ප්‍රතිපිළිතුරු ප්‍රකාශයන් ඉදිරිපත් කර තිබේ.

පාර්ශවයන්ගේ එකඟතාවයන්,

ඉහත දක්වෙන පරිදි අදාළ පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීම් සැළකිල්ලට ලක් කිරීමේ දී මෙකී ආරාවුල සම්බන්ධයෙන් පාර්ශවයන් අතර පහත සඳහන් එකඟතාවයන් පවත්නා බව නිරීක්ෂණය වූ අතර ඒවා පහත පරිදි දැක්විය හැකි ය.

01. පළමු පාර්ශවයේ පළමු සේවකයාගේ (එච්. ඩී. ඒ. එස්. සෙනෙවිරත්න) මුල් පත්වීම් දිනය 2011.06.01 වන දින බව.

ඔහුට ගෙවිය යුතුව ඇති ප්‍රවාහන දීමනාව රු. 2,170,967.74 ක් බව. එම මුදල සමාන වාරික 12 කට බෙදා ඉන් වාරික 04 ක් දැනටමත් ගෙවා අවසන් කර ඇති බව. ඒ අනුව ඔහුට ගෙවීමට ඇති ඉතිරි මුදල රු. 1,447,311.86 ක් බව.

02. පළමු පාර්ශවයේ දෙවන සේවකයාගේ (ජී. ඩී. තිදස් හරිචන්ද්‍ර) මුල් පත්වීම් දිනය 2011.07.01 දින බව.

ඔහුට ගෙවිය යුතුව ඇති ප්‍රවාහන දීමනාව රු. 2,350,401.31 එම මුදල සමාන වාරික 12 කට බෙදා ඉන් වාරික 04 ක් දැනටමත් ගෙවා අවසන් කර ඇති බව. ඒ අනුව ඔහුට ගෙවීමට ඇති ඉතිරි මුදල රු. 1,566,937.16 ක් බව.

03. පළමු පාර්ශවයේ තෙවන සේවකයාගේ (එන්. එස්. එස්. කුමාරගේ) මුල් පත්වීම් දිනය 2011.07.01 බව

ඔහුට ගෙවිය යුතුව ඇති ප්‍රවාහන හා රියදුරු දීමනාව රු. 3,376,400.00 ක් බව. මෙම මුදල සමාන වාරික 12කට බෙදා ඉන් වාරික 04 ක් දැනටමත් ගෙවා අවසන් කර ඇති බව. ඒ අනුව ඔහුට ගෙවීමට ඇති ඉතිරි මුදල රු. 2,250,933.33 ක් බව.

මෙම සේවකයන් තිදෙනා වෙනුවෙන් ගෙවිය යුතුව ඇති මුළු මුදල රු. 5,265,182.35 ක් බව. පාර්ශවයන්ගේ ඉහත සඳහන් එකඟතාවයන්ට යටත්ව මෙම නඩුව විභාගයට ගැනීම සඳහා දින නියම කරන ලද අතර, පළමු දිනයේ දී වගඋත්තරකාර පාර්ශවය කිසිදු දැනුම්දීමකින් තොරව අධිකරණය ඉදිරියේ පෙනී නොසිටියේ ය. කෙසේ වෙතත් නඩුව විභාගයට ගැනීම සඳහා නැවත දින ලබා දුන් අතර එදින දෙපාර්ශවය ම අධිකරණය ඉදිරියේ පෙනී සිටියහ. මෙම අවස්ථාවේ දී අධිකරණය විසින් පාර්ශවයන් වෙත පැහැදිලි කර දෙන ලද්දේ කිසියම් වූ සමථයකට එළැඹීමේ ඇති වැදගත්කමයි. ඒ සම්බන්ධයෙන් එකඟතාවයක් නොදක්වන්නේ නම් නඩුව විභාගයට ගැනීමට කටයුතු කරන බව ද පාර්ශවයන් වෙත දැනුම් දෙන ලද අතර එහිදී පැමිණිලිකාර පාර්ශවය සමථ යෝජනාවන් වගඋත්තරකාර පාර්ශ්වය වෙත ඉදිරිපත් කර සිටියේ ය.

එමගින් ප්‍රකාශ වූයේ තමන් වෙත ලැබිය යුතු මුළු මුදලින් රුපියල් ලක්ෂ පහක (රු.500,000/-) මුදලක් අඩුකර ඉතිරි මුදල එනම් රුපියල් හතලිස් හත් ලක්ෂ හැටපන් දහස් එකසිය හැත්ත නවයයි ශත තිස් පහක (රු.4,765,179.35ක) මුදල මාස හයක කාලයක් තුළ ලබා දීමට කටයුතු කරන ලෙසයි. (මෙහිදී මුළු මුදල සම්බන්ධයෙන් සළකා බැලීමේ දී රුපියල් තුනක අඩුවීමක් පෙන්නුම් කළ ද එය නොසලකා හැරීමට තීරණය කෙරිණ.)

පැමිණිලිකාර පාර්ශවයේ මෙම සමථ යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා දින ලබා ගත් වගඋත්තරකාර පාර්ශවය ඉන් අනතුරුව ප්‍රකාශ කර සිටියේ එකී මුදල සමාන වාරික 12 කින් ගෙවීමට තමන් එකඟතාවයකට එළඹෙන බවයි. ඒ සම්බන්ධයෙන් ලිඛිතව ම කරුණු දක්වන ලෙස වගඋත්තකාර පාර්ශවයට අධිකරණය විසින් නියම කරන ලදුව වගඋත්තරකාර පාර්ශ්වය ඊට ප්‍රතිචාර දක්වමින් 2019 අගෝස්තු මස 27 වැනි දිනැතිව ගෙවීම් පිළිබඳ විස්තරයක් සහිතව ලිඛිත එකඟතාව අධිකරණය වෙත ඉදිරිපත් කර සිටියේ ය.

එම එකඟතා ලියවිල්ලේ ඇතුළත් ගෙවීම් විස්තරය පහත පරිදි වේ.

| නම | ගෙවිය යුතු මුදල | වාරිකයක වටිනාකම |
|---|---|---|
| ඩබ්. ජී. එස්. සෙනෙවිරත්න | රු.1,309,869.93 | රු.109,155.83 |
| ජී. ඩී. තිදස් හරිචන්ද්‍ර | රු.1,418,132.56 | රු.118,177.71 |
| එන්. එස්. එස්. කුමාරගේ | රු.2,037,176.71 | රු.169,764.73 |

**ප්‍රදානය**

මෙම නඩුවට අදාළ පාර්ශවයන්ගේ සමථමය එකඟතාවයන්ට අනුව සෙනෙවිරත්න යන අයට රු.1,309,869.93 ක මුදලක් ලැබෙන සේ රු. 109,155.83 ක සමාන වාරික 12 ක් ද, හරිචන්ද්‍ර යන අයට රු.1,418,132.56 ක මුදලක් ලැබෙන සේ රු.118,177.71 සමාන වාරික 12 කින් ද, කුමාරගේ යන අයට රු.2,037,176.71 ක මුදලක් ලැබෙන සේ රු.169,764.73 ක සමාන වාරික 12 කින් ද, වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි හා වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 25 දින හෝ ඉන් පෙර ගෙවා අවසන් වන ආකාරයෙන් ද එකී මුදල් තම අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසු එකී සේවකයන්ට ලබාගත හැකි වන ආකාරයෙන් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙසට මින් නියෝග කරමි.

මෙම ප්‍රදාන සාධාරණවුත් යුක්ති සහගතවුත් එකක් බවට තීරණය කරමි.

වර්ෂ 2019 ක් වූ ඔක්තෝබර් මස 07 වන දින කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

බේරුම්කරු,
ලෝරා සුමතිපාල.

11 - 1252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.